# පුරාවිද්‍යා සංරක්ෂණ මූලධර්ම ගඩොල් සංරක්ෂණ ක්‍රමවේදය තුළ භාවිතයට ගෙන ඇති ආකාරය අධ්‍යයනය කිරීම

(ඓතිහාසික පොළොන්නරු නගරයේ ප්‍රතිමාගෘහ ඇසුරින්)

ඩබ්ලිව්. එම්. දිල්කා නිශාදි

පුරාවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. dilkanishadi1992@gmail.com

ප්‍රමුඛ පදඃ සංරක්ෂණය, ගඩොල්, තිවංකය, ලංකාතිලකය, ථූපාරාමය.

## හැඳින්වීම

පුරාවිද්‍යා විෂයය ධාරාව තුළ වූ ප්‍රධාන මූලිකාංගයන් අතර "සංරක්ෂණය" උදෙසා ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ස්මාරකයන්ගේ හා සෙසු පුරාකෘතීන්ගේ පැරණි ස්වාභාවය, කලාත්මකභාවය සේම මානව වටිනාකම ඒ ආකාරයට ම පවත්වා ගැනීම උදෙසා ගනු ලබන ක්‍රියාමාර්ගයන් සංරක්ෂණය වේ. පැරණි ස්මාරකයන් සංරක්ෂණය කිරීම තුළ නිර්මාණ අමුද්‍රව්‍ය භාවිතය වැදගත් වේ. ස්මාරක නිර්මිත කළුගල්, ගඩොල්, පස්, දැව යන මාධ්‍යයන් අතරින් ගඩොල් සුවිශේෂී මාධ්‍යක් වශයෙන් හඳුනාගත හැකි ය.

## ක්‍රමවේදය

පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ද පැරණි ස්මාරක අතරින් ගඩොල් ස්මාරකයන්හි ස්වාභාවය හඳුනාගැනීම සහ ඒ හා සබැඳි සංරක්ෂණ ක්‍රමවේදයන් හඳුනාගැනීමයි. මෙහි දී අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතියික දත්තයන් ඔස්සේ කරුණු ගොනුගත කිරීම සිදුකර ඇත. වාස්තුවිද්‍යාත්මක වශයෙන් සංරක්ෂණ ක්‍රමවේදයන් ගඩොල් ස්මාරක සංරක්ෂණ ක්‍රියාදාමය තුළ භාවිතයට ගෙන ඇති ආකාරය තෝරාගත් ක්ෂේත්‍රය මගින් අනාවරණය කිරීමට බලාපොරොත්තු වේ. මෙහිදී සංරක්ෂණ මූලධර්මයන් සහ ප්‍රායෝගික භාවිතයේ ස්වරූපය සොයා බැලීම ඔස්සේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත අධ්‍යයනය කළ අතර අධ්‍යයනය කිරීමේ දී මෙම ක්‍රමවේද ද්විත්වය සඳහාම ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව


සර්ම කලාපීය රටක් වශයෙන් ලංකාව තුළ ස්මාරක නිර්මාණය කිරීමේ දී ගඩොල් භාවිතා කර ඇති ආකාරය එළිදැක්වෙන හොඳම නිදර්ශනය වන්නේ පොළොන්නරුව ඓතිහාසික නගරයයි. ක්‍රිස්තු පූර්ව 6 වැනි සියවස තරම් දක්වා ඈත අතීතයට උරුමකම් කියන පොළොන්නරු රාජධානිය එකොළොස්වැනි සියවසේ සිට දහතුන්වැනි සියවස දක්වා ලංකාවේ මධ්‍යකාලීන අගනගරය බවට පත්විය. පොළොන්නරුවේ පැරණි නගරය නූතනය වනවිට අක්කර 300ක පමණ (හෙක්ටයාර 112) ප්‍රදේශයක් පුරා පැතිර පවතී. එළිමහන් කලාපීයව ගඩොල් ස්මාරක සංරක්ෂණය පිළිබඳ ව මෙම අධ්‍යයන ක්ෂේත්‍රය මගින් හොඳම නිදර්ශනයන් සපයාගත හැකි ය. තිවංක පිළිමගෙය, ලංකාතිලකය සහ ථූපාරාමය යන ප්‍රතිමා ගෘහ යන වාස්තුවිද්‍යාත්මක ගඩොල් ස්මාරකයන් ඇසුරෙන් මූලික පුරාවිද්‍යාත්මක කටයුතු ඇතුළු ව

සංරක්ෂණ ප්‍රවේශය, සංරක්ෂණයේ ස්වරූපය, සංරක්ෂණ ක්‍රමවේද යනාදිය අධ්‍යයනයට ලක්කළ හැකි ය.

ගඩොල් සංරක්ෂණ ක්‍රමවේදය තුළ ස්මාරක උදෙසා කරන මැදිහත්වීම මත ස්මාරකයන්ගේ පැවැත්ම රඳාපවතිනු ලබයි. මෙහි දී ස්මාරකයේ ස්වරූපය සේම පාරිසරික හු දර්ශනය කෙරෙහි ද මූලික අවධානයක් යොමු කරමින් කටයුතු කිරීම සිදුකරනු ලබන ආකාරයක් හඳුනාගැනීමට හැකි ය. ගඩොල් ස්මාරක සංරක්ෂණය පිළිබඳ මූලික ව අවබෝධකර ගතයුතු කරුණ වන්නේ එම ස්මාරකයන් සංරක්ෂණයට පෙර, සමකාලීන ආරක්ෂණ ක්‍රමවේද හා සිදුකළ යුතු නූතන සංරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව ය. සංරක්ෂණයේ ප්‍රධාන මැදිහත්වීම් මට්ටම් වන ආරක්ෂා කිරීම, තහවුරු කිරීම, ප්‍රතිසංස්කරණය, පුනුරුත්ථාපනය හා නැවත ගොඩනැගීම යන ප්‍රභේදයන් ඔස්සේ කරුණු එක්රැස් කොට ගොනු කර ඇත.

පොළොන්නරුවේ ඇති ථූපාරාමය, ලංකාතිලකය හා තිවංකය යන ප්‍රතිමාගෘහයන් ත්‍රිත්වය වනාහි ගෙඩිගේ සම්ප්‍රදාය පිළිබඳ ව හඳුනාගැනීමට හැකි හොඳම නිදර්ශනයන් ය. මෙම ගෘහයන් උදෙසා භාවිත ගඩොල් සංරක්ෂණ ක්‍රමවේදය තුළ ඒ එක් එක් ප්‍රතිමාගෘහයේ ව්‍යුහාත්මක ස්වරූපයට සරිලන ආකාරයෙන් සංරක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කර ඇති ආකාරය හඳුනාගන්නට හැකි ය.

ගඩොල් මාධ්‍ය භාවිතය සේම ඉදිකිරීම් ක්‍රමවේදයේ පරිවර්තනයක් සමග ගෙඩිගේ භෞතික ස්වරූපය වෙනසකට භාජනය කරන ලද්දා වූ නිර්මාණයන් වශයෙන් මෙම පිළිමගෙවල් ත්‍රිත්වය හඳුනාගැනීමට හැකි ය. ගඩොළු කැබලි, හුණු හා බොරළු බන්ධන මාධ්‍ය වශයෙන් භාවිතා කර ඇති මෙම ගෘහයන්හි උසට බඳින ලද බිත්ති මගින් ගොඩනැගිල්ලේ බර දරා සිටීමට ආධාර සැපයී ඇත. නිර්මාණ තාක්ෂණය තුළ බිත්තිවල පිට පෘෂ්ටයේ සැරසිලි බහුල විමාන හා දේවතා රූපවලින් සරසා ආරුක්කු බැඳීමේ ශිල්පය හා තාක්ෂණය මනාව ගොඩනංවන ලද ස්මාරකයන් වශයෙන් වැදගත් වේ. පිටත බිත්තීන්හි සරසන ලද දේවතා රූප කෙරෙන් ඇතැම්විට අලංකරණයක් සේම ආරක්ෂාවක් ද බලාපොරොත්තු වූවාදැ'යි නිශ්චය කිරීම නිවැරදි වනු ඇත. මනුෂ්‍ය ශරීරයෙහි සෞන්දර්යය, ලාලිත්‍ය හා නම්‍යශීලීත්වය ප්‍රතිනිර්මාණය කිරීමේ දී තත්කාලීන සම්භාව්‍ය ශෛලිය උපයෝගී කරගෙන ඇති අයුරු හඳුනාගැනීමට හැකි ය. සංස්කෘතික සම්මිශ්‍රණ ලක්ෂණයන් අනුව හින්දු ආගමික ආභාසයන් ලබා ඇති බව මෙම ප්‍රතිමාගෘහයන් මනාව අධ්‍යයනය කිරීම මගින් පැහැදිලි වූ කරුණකි. මෙම පිළිමගෙවල මාධ්‍යය භාවිතයේ ස්වරූපය මෙසේ ය.





ප්‍රතිමාගෘහයන්හි සමස්ත ස්තර ව්‍යුහය අධ්‍යයනය කිරීමෙන් ගඩොල් සංරක්ෂණ ක්‍රියාවලිය තුළ කෙතරම්දුරට ස්මාරකයේ ආරක්ෂාව සුරක්ෂිත වන්නේදැ'යි නිර්ණය

කළ හැකි වේ. ස්තර ව්‍යුහය අධ්‍යයනය කිරීමෙන් ගඩොල් සංරක්ෂණ ක්‍රියාවලිය තුළ කෙතරම්දුරට ස්මාරකයේ ආරක්ෂාව සුරක්ෂිත වන්නේද'යි නිර්ණය කළ හැකි වේ. සංරක්ෂණ ක්‍රියාවලියේ දී ස්මාරකයේ ආරක්ෂාව උදෙසා ව්‍යාජ බිත්ති එළියට නොපෙනෙන සේ සකස් කිරීමක් මෙම පිළිමගෙවල් උදෙසා භාවිත කරන ලද සංරක්ෂණ ක්‍රමවේදයකි. ව්‍යාජ කුළුණු සකස්කිරීම තුළ ස්මාරකය මගින් එළිදැක්වෙන සෞන්දර්යය කෙරෙහි ද මූලික සැලකිල්ලක් දක්වා ඇති බව පැහැදිලි කරුණකි. ථූපාරාමය, ලංකාතිලකය හා තිවංකය මේ සඳහා හොඳම නිදර්ශනයන් සපයනු ලබයි. ප්‍රතිමාගෘහයන් ත්‍රිත්වයේ සිදුකරන ලද්දා වූ සංරක්ෂණ ක්‍රමයන්හි භාවිත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දී ගඩොල්වරි ශක්තිමත් කිරීම තුළ දුර්වල මට්ටමේ වූ ගඩොල් සම්පූර්ණයෙන් ම ගලවා ඉවත් කිරීම හෙවත් යතාවත් කිරීම සිදුකර තිබේ.

ගඩොල් ස්මාරක සංරක්ෂණ මූලධර්මයන් අතර බදාමය හා ගඩොල් අතර පවත්නා සබඳතාවය අවබෝධ කරගැනීම වඩා වැදගත් වේ. මෙම සබඳතාවය මනාව තේරුම්ගැනීම තුළ ථූපාරාමය, ලංකාතිලකය හා තිවංකය යන අධ්‍යයනයට පාදක කරගන්නා ලද ප්‍රතිමාගෘහයන්හි සංරක්ෂණ කාර්යය සිදුකර තිබේ. පැරණි ගඩොල්වලට නව බදාමය යෙදීම තුළ සංරක්ෂණ මූලධර්මයන් අනුව යමින් අවශ්‍ය ප්‍රමාණයෙන් බන්ධන මාධ්‍යය වශයෙන් ශක්තිමත්භාවය රඳාපවත්වා ගැනීම උදෙසා භාවිතා කර ඇත්තේ සිමෙන්ති ය.

ගඩොල් සංරක්ෂණ ක්‍රමවේදයන් භාවිතයට ගැනීම තුළ, ප්‍රතිසංස්කරණය සෑම සංරක්ෂණ කාර්යයකම ප්‍රමුඛ වෙමින් මෙම ප්‍රතිමාගෘහ ත්‍රිත්වය තුළ විවධ ක්‍රමවේදයන් ඇසුරින් භාවිතයට ගෙන ඇති අයුරු අධ්‍යයනයට ලක්විය. සමස්තය ගොනුගත කිරීම තුළ පිළිමගෙවල් උදෙසා භාවිත සංරක්ෂණ ක්‍රමවේදයන් පහත වගුවේ දක්වා ඇත.

ගඩොල් සංරක්ෂණ ක්‍රියාවලිය තුළ භාවිත ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීමේ දී එක් එක් ස්මාරකයන්ගේ දීර්ඝකාලීන පැවැත්ම තහවුරු කරගැනීම උදෙසා මූලික වශයෙන් ම ප්‍රතිසංස්කරණය භාවිතා කර ඇති ආකාරය හඳුනාගැනීමට හැකි ය. ස්මාරකයන් නිවැරදිව අනාවරණය කර ගැනීම තුළ යෝග්‍ය වූ සංරක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කරගෙන ඇති ආකාරයක් නිරීක්ෂණය කළහැකි විය. සෑම අවස්ථාවකදී ම අවම මැදිහත් වීමේ ස්වරූපයක් ස්මාරකයන් සඳහා යොමුකර තිබේ. සෑම අවස්ථාවකදී ම මුල් බදාමයම භාවිතයට ගනිමින් සංරක්ෂණ ක්‍රියාවලිය



සිදුකර ඇත්තේ සංරක්ෂණ මූලධර්මයන් ඉක්මවා නොයන පරිද්දෙන් වීම අධ්‍යයනය මගින් අනාවරණය කරගන්නට හැකි වූ කරුණකි. පැරණි ස්මාරක ආරක්ෂා කිරීමේ වර්තමාන අවශ්‍යතාවය මත ඉදිකිරීම් අමුද්‍රව්‍ය මනාව හඳුනාගැනීම තුළ මෙම ස්මාරකයන්ගේ සංරක්ෂණ කටයුතු සිදුකර ඇති ආකාරය හඳුනාගැනීමට පුළුවන. පැරණි ඉදිකිරීම් අමුද්‍රව්‍යට හානි නොවන ආකාරයෙන් නිවැරදි අවබෝධයක් සහිත විධිමත් ක්‍රියාපටිපාටියකින් යුක්තව ගඩොල් සංරක්ෂණ ක්‍රමවේදයන් භාවිතයට ගෙන ඇති ආකාරය මෙම අධ්‍යයනය හරහා හඳුනාගැනීමට හැකි විය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Basnayake, H. T. (1986) **Sri Lanka Monastic Architecture**. Sri Sapthaguru Publication. Delhi. India.

Hocart, A. M. (1926) **Archaeology Survey of Ceylon' VOL II** . Government Printers. Ceylon.

Bell, H. C. P. (1914) **Archaeology Survey of Ceylon' Annual Report (1910-11)**. Archaeology Department. Colombo.

Bell, H. C. P. (1914) **Archaeology Survey of Ceylon' Annual Report (1911-12)**. Archaeology Department. Colombo.